යම් පුද්ගලයෙකු කොවිඩ්-19 රෝගියෙකු වීම කිසිසේත්ම එම පුද්ගලයාගේ වරදක් නොවේ. එසේ තිබියදීද ඇතැම් පුවත්පත් මගින්, නවකොරෝනා වෛරසය ආසාදනය වූ පුද්ගලයින් සමාජයේ කොන් කිරීමට සහ ගර්හාවට පාත්‍ර වීමට ඉඩ හසර පෑදීමට උත්සාහ ගනී.පහත දැක්වෙන අරුණ පුවත්පතේ පළවූ ලිපියේ සිරස්තලය උක්ත දැක්වූ ආකාරයේ ආචාර ධාර්මික නොවන වාර්තාකරණයට නිදසුනකි.

කොවිඩ්-19 ආසාදිත පුද්ගලයෙකු "කොවිඩ් කතක්" ලෙසින් හැඳින්වීම කෙතරම් ජනමාධ්‍ය ආචාර ධර්ම හෝ ශික්ෂිත ලෝකයේ සදාචාරාත්මක අගයන් සමගින් සැසඳේද යන්න පාඨකයන් ලෙසින් අප ප්‍රශ්න කළ යුතුවේ. ඒ අතර දිවයින පුවත් පත මගින් ඊට සමාන පුවතක්, ආචාර ධාර්මික ලෙස පළ කර තිබෙන ආකාරයද සංසන්දනය සඳහා අපි පළකරමු.

මෙවන් යෙදුම් ඔස්සේ සමාජගත වන කොවිඩ්-19 රෝගීන් හා සැකසහිතව නිරෝධායනයේ හිඳින්නන් පිළිබඳව වන ගර්හාත්මක මතයන් ඔස්සේ, කොවිඩ්-19 මර්දන සටනටද බාධා එල්ලවන්නේ නොවේද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #COVID19 #Coronavirus
#Aruna #Divaina